සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

06 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 15 S I

**ක්‍රිස්තියානි ධර්මය - I** | කාලය පැය දෙකයි

නම හා විභාග අංකය

සැලකිය යුතුයි :- ● ප්‍රශ්න සියල්ලටම පිලිතුරු සපයන්න. නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

● අංක 1-5 දක්වා ප්‍රශ්න වලට අදාළ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. දේව මැවිල්ල පිළිබඳ සඳහන් බයිබල් ග්‍රන්ථය වනුයේ
(i) උත්පත්ති (ii) නික්මයාම (iii) ජෙරමියා (iv) එළිදරව්ව

2. ජේසුස් වහන්සේගේ කුරුසිය උසුලාගෙන යාමට උන්වහන්සේට සහාය වූයේ,
(i) නිකදේමුස් (ii) බරබ්බාස් (iii) සිරේනියේ සීමෝන් (iv) අන්තජාති වාදී සීමෝන්

3. ජේසුස් වහන්සේගේ බෞතිස්ම මොහොතේ ආත්මයාණන් වහන්සේ ප්‍රකාශ වූ සලකුණ වනුයේ,
(i) ගිනි දැල්ල (ii) පරවියා (iii) වලාකුළු (iv) සැඩ සුළඟ

4. ක්‍රිස්තුස් වහන්සේගේ නිහතමානිකම ප්‍රකාශ වූ ප්‍රබල සිදුවීමකි.
(i) කානා නුවර වතුර මිදිරසට හැරවීම (ii) යයිරස්ගේ දියණිය මරණින් නැගිටුවීම
(iii) ශ්‍රාවකයන්ගේ පාද දෝවනය (iv) උත්ථානයෙන් පසු දර්ශනය වීම

5. ශු. බයිබලයේ පැරණි ගිවිසුම මුලින් ම ලියන ලද භාෂාව වනුයේ,
(i) ග්‍රීක භාෂාව (ii) හීබෲ භාෂාව (iii) ලතින් භාෂාව (iv) අරමයක් භාෂාව

● අංක 6 සිට 10 දක්වා ප්‍රශ්න හරි නම් √ ලකුණ ද, වැරදි නම් × ලකුණ ද යොදන්න.

6. දේව මැවිල්ලේ සැපයුම්කරු වන්නේ මිනිසාය. (..................)
7. ජේසුස් වහන්සේගේ ප්‍රධානතම ශ්‍රාවකයා වූයේ පාවුළු තුමාය (..................)
8. ජේසුස් වහන්සේ ප්‍රසිද්ධ ජීවිතයට පෙර පාළුකරයේ දින 40 ක් යාච්ඤා කළ සේක (..................)
9. දෙවියන් වහන්සේට සියල්ල කළ හැකි බව විශ්වාස කිරීම ඇදහිල්ලය (..................)
10. එඬේරෙකු වූ ජෙස්සේ ජීවත් වූ ග්‍රාමය වන්නේ ජෙරුසලමයි (..................)

● අංක 11-15 දක්වා ප්‍රශ්න A කොටසට ගැළපෙන පිළිතුර B තෝරා කොටසින් යා කරන්න.

| | A | B |
|---|---|---|
| 11. | දෙවියන් වහන්සේ සයවන දින මවන ලද්දේ | ජුදෙව්වන්ගේ රජ |
| 12. | ජේසුස් වහන්සේට අදාළව කුරුසිය මත සටහන් කළ ප්‍රකාශය වූයේ | ජෙරුසලම |
| 13. | ජේසුස් වහන්සේගේ ස්වර්ගාරෝහනයෙන් දින 10කට පසු යෙදී තිබූ මංගල්‍යය වූයේ | මිනිසා |
| 14. | වයස අවුරුදු 12 දී පාස්කුව සැමරීමට ජේසුස් වහන්සේ පැමිණියේ | පිලිස්ති |
| 15. | ඊශ්‍රායෙලය ආක්‍රමණය කළ ගොලියත් අයත් ජාතිය වූයේ | පෙන්තකොස්තය |

● අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන තුළින් තෝරා අදාළ හිස්තැනෙහි ලියන්න.

(සමාව/ කල්වාරි/ රාමා/ මනස්ථාප/ ප්‍රේමය/උපස්ථායකයින්)

16. සමිඳාණෝ යහපත්ය. එතුමන්ගේ ............................................ ස්ථීරය
17. ජේසුස් වහන්සේ අප වෙනුවෙන් ............................................... කන්දේදි දිවි පිදූ සේක
18. මුල් සභාව තුළ සහනාධාර බෙදා දීමේදී සහායවීමට ............................................... තෝරා පත්කර පත්හ.
19. තම පව් ගැන ............................................... වෙමින් කරන කන්නලව්ව දෙවියන් වහන්සේ පිළිගන්නා සේක
20. සාමුවෙල් උපන් නරගය වනුයේ ............................................... ය.

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

06 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 15 S II

## ක්‍රිස්තියානි ධර්මය - II

සැලකිය යුතුයි :- ● ප්‍රශ්න 06 කට පමණක් පිළිතුරු සපයන්න.

1. (i) දෙවියන් වහන්සේ පළමු දින මවන ලද දේවල් දෙක ලියන්න.
   (ii) දෙවියන් වහන්සේ ශුද්ධ දිනයක් ලෙස ආසිරි පැතූ සබත් දින අප කළ යුතු ප්‍රධාන කාර්යයන් 03 ලියන්න.
   (iii) දේව මැවිල්ල භාර දුන් මිනිසා එය රැකගැනීමට කළ යුතු දේවල් 5 ක් ලියන්න. (2 + 3 + 5)

2. (i) ගාබ්‍රියෙල් දේව දූතයා මරියතුමියට ක්‍රිස්තු උපත දැනුම් දීමේදී කියූ ප්‍රධාන කරුණු 2 ලියන්න.
   (ii) ශාස්ත්‍රවන්තයින් ජේසුස් වහන්සේට පුදන ලද ත්‍යාගයන් 3 ක් ලියන්න.
   (iii) නත්තල සැමරීම සම්බන්ධව කිතුනුවන් යොමු වන යහපත් පිළිවෙත් 5 ක් ලියන්න. (2 + 3 + 5)

3. (i) ජේසුස් වහන්සේ කුරුසියේ ඇණ ගැසූ ස්ථානය හඳුන්වන හීබෲ වචනය හා එහි අර්ථය ලියන්න.
   (ii) ජේසුස් වහන්සේගේ කුරුසිය පාමුල සිට උන්වහන්සේට කවටකම් කළ කණ්ඩායම් 3 ක් ලියන්න.
   (iii) "එම්මාවුස් ගමන" සිදුවීම පිළිබඳ ප්‍රධාන කරුණු 5 ක් ලියන්න. (2 + 3 + 5)

4. (i) උපස්ථායකයින් දෙදෙනක් නම් කරන්න.
   (ii) සමාරියේ සුභාරංචිය පිළිගත් කණ්ඩායම් 3 ක් ලියන්න
   (iii) යහපත් සමරිතානුවරයාගේ උපමාවෙන් ඔබට ලැබෙන මඟපෙන්වීම් 5 ක් ලියන්න. (2 + 3 + 5)

5. (i) ''ජේසුස් වහන්ස, ආචාරිනි අපට කරුණා කළ මැනව'' කී ලාදුරු රෝගීන්ට ජේසුස් වහන්සේ දුන් පිළිතුර ලියන්න.
   (ii) පරිසිවරයා හා අයකැමියා පිළිබඳ උපමාවේදී පරිසිවරයා යැදුමේදී පැවසූ කරුණු 3 ලියන්න.
   (iii) දෙවියන් වහන්සේ ඉදිරියේ අපගේ යැදුම් වලදී අප කළ යුතු දේවල් 5 ක් ලියන්න. (2 + 3 + 5)

6. (i) ශු.බයිබලය යන වචනය බිඳී එන ග්‍රීක වචනය හා එහි අර්ථය ලියන්න
   (ii) ශු. බයිබලයේ නීති පොත් 3 ක් ලියන්න
   (iii) ශු. බයිබලය පිළිබඳ ඔබ දන්නා කරුණු 5 ක් ලියන්න. (2 + 3 + 5)

7. (i) දෙවියන් වහන්සේ මැවූ පළමු මිනිසා හා ස්ත්‍රිය නම් කරන්න.
   (ii) මිනිසා අතර යහපත් සබඳතා ගොඩනංවන දේව ආඥා 3 ක් ලියන්න.
   (iii) නව ගිවිසුමේ කන්ද උඩ දේශනාවෙන් ලැබෙන මඟ පෙන්වීම් 5 ක් ලියන්න. (2 + 3 + 5)

8 (i) මෝසස්ගේ සහෝදරයා හා සහෝදරිය නම් කරන්න.
   (ii) මෝසස්ගේ මවගේ නම හා පියාගේ නම හා අයත් ගෝත්‍රය ලියන්න.
   (iii) ඔබගේ නිවසේ සොයුරු සොයුරියන් හෝ පාසලේ මිතුරු මිතුරියන්ගේ යහපත උදෙසා ඉටු කළ හැකි ක්‍රියාවන් මාර්ග 5 ක් ලියන්න. (2 + 3 + 5)

# තෙවන වාර පරීක්ෂණය - 2019

## ක්‍රිස්තියානි ධර්මය

06 ශ්‍රේණිය

## පිළිතුරු පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | (i) | 2. | (iii) | 3. | (ii) | 4. | (iii) |
| 5. | (ii) | 6. | X | 7. | X | 8. | √ |
| 9. | √ | 10. | X | 11. | (මිනිසා) | 12. | (ජුදෙව්වන්ගේ රජු) |
| 13. | (පෙන්තකොස්තය) | 14. | (ජෙරුසලම) | 15. | (පිලිස්ති) | 16. | (ප්‍රේමය) |
| 17. | (කල්වාරි) | 18. | (උපස්ථායකයින්) | 19. | (මනස්ථාප) | 20. | (රාමා) |

1. (i) දවාල - රාත්‍රිය
   (ii) * දෙවිදුන්ට ගෞරව කිරීම
   * ස්තුති පූර්වකව ප්‍රශංසා කිරීම
   * දේව නමස්කාරයට සහභාගි වීම
   (iii) * මැවිල්ල වැඩි වර්ධනය කිරීම
   * ගස් සිටුවීම
   * පරිසරය විනාශ නොකිරීම
   * දේව මැවිල්ල අනාගත පරපුරට ද සංරක්ෂණය කිරීම
   * දේව මැවිල්ල වෙනුවෙන් දෙවිදුන්ට තුති පිදීම
   * මැවිල්ල අලංකාර කිරීම
   ආදී කරුණු

2.(i)ළදරුවාගේ නම ජේසුස් විය යුතු බව එතුමාණෝ මිදුම්කරුවාගේ බව
(ii)රත්තරන්, තුවරලා, ගන්ධරස
(iii)*අන් අයට උදව් කිරීම
*අසල්වැසියන් සමඟ ආහාරපාන බෙදා ගැනීම
*දේව මාළිගාව යාම හා දෙවිදුන් නැමදීම
*දුගී දුප්පත් අයට උදව් කිරීම
*කිතු උපත අරඹයා දෙවිදුන්ට ප්‍රශංසා කරමින් කැරොල් ගී ගායනය.
*සියලුදෙනා සතුටින් සාමයෙන් සිටිම්.
ආදි කරුණු

3. (i) හීබෲ - ගොල්ගොතා
   අර්ථය - කපාල පිටිය
   (ii) නායක පූජකයන්/ ප්‍රජා මූලිකයන්/ විනයධරයන්
   (iii) * පාස්කු දින ක්ලෝපස් හා තවත් ක්‍රිස්තු ශ්‍රාවකයෙකු සමඟ උත්ථාන වූ ජේසු ගමන් කළ සේක
   * කිසිවෙකු උන්වහන්සේ හඳුනා නොගත්හ.
   * නමුත් ජේසුස් වහන්සේ ඔවුන් සමඟ කෑමට හිඳගත් මොහොතේ රොටි ආශිර්වාද කොට කඩා දුන් සේක
   * ඒ අවස්ථාවේ ඔවුන් ජේසුස් වහන්සේ හඳුනාගත්හ.
   * ඔවුන් ක්‍රිස්තු උත්ථානයේ සාක්ෂිකරුවන් වී ජෙරුසලමට පැමිණියහ.

4. (i) ස්තේපන්, පිලිප් .................
   (ii) රෝගීන්, කොරුන්, අශුද්ධාත්මාවේශ වූවන්
   (iii) * තරාතිරමේ නොබලා සෑම කෙනෙකුට අපගේ නිරන්තර සැලකිල්ල යොමු කිරීම
   * අපට ඇති සම්පත් අන් අයගේ අවශ්‍යතා වෙනුවෙන් වැය කිරීම
   * සෑම විටම ප්‍රේමයෙන් අන් ජීවිත නගා සිටුවීමට ක්‍රියා කිරීම
   * ප්‍රති උපකාර අපේක්ෂාවෙන් තොරව උපකාර අවශ්‍ය අයට සහාය වීම
   * අසල්වැසියාට ප්‍රේම කිරීම සඳහා තමාම කැපවීම ආදී කරුණු

5. (i) ගිහින් ඔබේ පූජකවරුන් ඉදිරියේ පෙනී සිටින්න
   (ii) * මම මේ අයකැමියා වන්නෙක් නොවෙමි
   * සතියකට දෙවරක් උපවාස කරමි
   * උපයන දෙයින් දසයෙන් කොටස දෙමි
   (iii) * අප පසුතැවිලි වූ හදකින් උන්වහන්සේ වෙත ළඟා වෙමු
   * අප කළ වැරදි සිහි කරමින් උන්වහන්සේගෙන් සමාව ලබමු.
   * උන්වහන්සේ පමණක් දැහැමි බව මතක තබා ගනිමින් එම දැහැමි බව අප ජීවිත වලට ද අයැද සිටිමු.
   * දෙවියන් වහන්සේ සමඟ නියම සබඳතාවයට අප පත්වෙමු.
   * උන්වහන්සේගේ දයානුකම්පාවට අපි භාර වෙමු
   ආදි කරුණු

6 (i) බිබ්ලියොත් - පොත් ගණනාවක එකතුව
   (ii) උප්පත්ති නික්මයාම, ලෙවි ව්‍යවස්ථාව, ගණන් කතාව, ද්විතීය නීති සංග්‍රහය.
   (iii) * කිතුනුවන්ගේ පූජනීය ග්‍රන්ථය
   * බයිබලය ලේඛනගත වූයේ වයස අවුරුදු 1200ක පමණ කාලයක දීය
   * ප්‍රධාන කර්තෘ දෙවියන් වහන්සේය. මිනිසා උපකතුවරයාය.
   * පළමුව දේව වචනය ලියවුණේ පැපිරස් කොළ වලින් සාදා ගත් හැකුළුම් පත් හෙවත් ස්ක්‍රෝල් වලය
   * ශු . බයිබලය යන වචනය බිඳී එන ග්‍රීක වචනය බිබ්ලියොත් යන්නය.
   * බයිබලයේ ප්‍රධාන කොටස් 2 කි ආදී කරුණු

7. (i) ආදම් - ඒව
   (ii) * පියාට ද, මවට ද ගෞරව කරන්න.
   * මිනී නොමරන්න
   * කාම මිත්‍යාචාරය නොකරන්න
   * සොරකම නොකරන්න
   * අනුන්ට විරුද්ධව බොරු චෝදනා නොකරන්න
   * අසල්වැසියන්ගේ දේට ඇළුම් නොවන්න
   (iii)*අන් අයගේ ජීවිතයට ආලෝකයක් වීම
   *එකට එක නොකිරීම
   *පලිගැනීමෙන් තොරව වරදක් කළ අයට ප්‍රේමයෙන් පිළි ගැනීම
   *සතුරන්ට පවා ප්‍රේම කිරීම
   *අපට පීඩා කරන්නන් උදෙසා යාච්ඤා කිරීම
   *යාච්ඤාව තුළ අප අවශ්‍යතා දෙවිදුන්ට ඔප්පු කිරීම
   *කිසිවක් පිළිබඳ වුවමනාවට වඩා කරදර නොවීම

8. (i) මිරියම් හා ආරෝන්
   (ii) මව - ජොකෙබෙද්
   පියා - අම්රම්
   ගෝත්‍රය - ලෙවි
   (iii) සිසුන් ලියා ඇති කරුණු සලකා බලා ලකුණු ලබාදෙන්න.